# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - 2010

## 1 මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය 2010 සෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරන ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රමිත
-------------------

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24**
----------------------------------

(අ) පිටස්තර ආයතන වලින් හෝ පුද්ගලයින් ගෙන් ලැබෙන ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 24 ප්‍රකාර ගිණුම් තැබීම සිදු නොකර එම ප්‍රදානයෙන් වියදම් දරා ඉතිරි වු රු.41,375 ක මුදලක් මුළු වියදම් වලින් අඩුකර දක්වා තිබුණි.

(ආ) ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලංකා බැංකුවෙන් ලද රු.150,000 ක ප්‍රදානය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 24 අනුව ගිණුම් තැබීම සිදුකර නොතිබු අතර එම මුදලින් ඉදිකළ රු.114,987 ක් වු ගොඩනැගිල්ලේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි. ඉතිරි මුදල වු රු. 35,013 ක මුදල පමණක් කෙර ගෙන යන වැඩවල වටිනාකමින් අඩු කොට දක්වා තිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කෙරේ.

(අ) ආදායම් වියදම් ගිණුමේ ගමන් වියදම් ශේෂය තුළ ඇතුළත් රු.1,888,881 ක විදේශීය ගමන් වියදම් වෙන්කර හඳුනාගෙන දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2009 වර්ෂයේදී 2010 වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.148,048 ක් වූ උපකරණ නඩත්තු වියදම්, සාමාජික මුදල් , වාර ප්‍රවේශ පත්‍ර දීමනා සහ අන්තර්ජාල සේවා වියදම්, 2010 වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට තවදුරටත් ඉදිරි ගෙවීම් ලෙස ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ඇ) දැනට විකුණා ඇති ආනයනය කළ පොත් තොගයක් වරායෙන් නිදහස් කර ගැනීමට ගෙවූ රු.342,875 ක නිෂ්කාශණ ගාස්තු වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට පෙර ගෙවීම් ලෙස ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

**1.2.3 ලැබිය යුතු ගිණුම්**

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබූ රු.මිලියන 29.4 ක අත්තිකාරම් වලින් 2011 සැප්තැම්බර් වන විට රු.මිලියන 11.69 ක අත්තිකාරම් පියවා නොතිබූ අතර නොපියවූ අත්තිකාරම් රු. මිලියන 1.2 ක් හඳුනාගත නොහැකිව තිබුණි. පියවා තිබූ අත්තිකාරම් රු.මිලියන 1.66 ක් සඳහා සාක්ෂි වශයෙන් ලියවිලි වල ජායා පිටපත් ඉදිරිපත් කර තිබූ බවද නිරීක්ෂණය විය.

(ආ) පෙර වර්ෂ වල සිට පැවත එන රු.398,591 ක ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

විවිධ කාර්යයන් සඳහා රු.570,622 ක මුදලක් වෙනත් ආයතන වල තැන්පත් කර තිබූ අතර තැන්පතු සහතික, ශේෂ සනාථ කිරීම් සහ ඒ පිළිබඳ ප්‍රභව ලියවිලි ආදිය නොමැතිවීම නිසා එම ශේෂයන් වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**1.2.5 නීති , රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම්**

--------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව පාලක මණ්ඩලය මගින් අනුමත කරන ලද සංයක්ත සැලැස්මේ පිටපත් මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය , රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව , මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2010 -2011 කාල පරිච්ඡේදයට අදාලව සකස් කර ඇති සංයුක්ත සැලැස්ම පාලක මණ්ඩලය මගින් අනුමත කිරීම හෝ නියමිත කාල වකවානු වලදී අදාල අංශයන්ට යොමු කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, පශ්චාත් උපාධි ආයතනය හා ස්වයං මූල්‍ය අරමුදල වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව රු.2,057,800 ක සමස්ථ ඌනතාවයක් පෙන්නුම් කරන ලද අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,261,041 ක ඌනතාවයක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී රු.14,203,241 ක මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් ඇතිවීම සඳහා රජයේ ප්‍රදාන, වෙනත් විවිධ ආදායම් හා ස්ථාවර වත්කම් විකිණීමේ ආදායම රු.20,695,519 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්ය සාධනය

(අ) විශ්වවිද්‍යාලයේ භෞතික හා මානව සම්පත් ඌණ උපයෝජනය

| වර්ෂය | ත්‍රිවිධ හමුදාවන් ඉල්ලුම් කල සංඛ්‍යාව | බඳවාගත් සිසුන් ප්‍රමාණය | ඉල්ලුම් කල සංඛ්‍යාවට වඩා අඩුවෙන් බඳවා ගත් ප්‍රමාණය | බඳවා ගත් සිසුන්ගෙන් ශිෂ්‍යභාවය අතහැර ඇති සංඛ්‍යාව | සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව | ඉල්ලීමට අනුව පුරප්පාඩු වල ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| 2006 | 130 | 109 | 21 | 12 | 33 | 25 % |
| 2007 | 122 | 92 | 30 | 10 | 40 | 33% |
| 2008 | 205 | 151 | 54 | 17 | 71 | 35 % |
| 2009 | 239 | 209 | 30 | 8 | 38 | 16 % |
| 2010 | 187 | 168 | 19 | 4 | 23 | 12 % |

ඉහත සටහන අනුව පසුගිය වසර 5 ක් තුල සිසුන් බඳවා ගැනීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී ත්‍රිවිධ හමුදා වලින් වාර්ෂිකව ඉල්ලුම් කරන ලද නිලධාරීන් සංඛ්‍යාවට සමාන ප්‍රමාණයක් සේවා ශිෂ්‍ය භටයන් බඳවා ගැනීම කලයුතු වුවත් සෑම වසරකම ඉල්ලුම් කල සංඛ්‍යාවට වඩා අඩුවෙන් බඳවාගෙන තිබුණි. එසේම බඳවාගන්නා ලද සේවා ශිෂ්‍යභට කණ්ඩායම් වලින්

පාඨමාලා අතහැර යන සිසුන් සංඛ්‍යාවද සලකා බැලීමේදී 2006 සිට 2010 දක්වා 12 % සිට 35 % දක්වා පරාසයක පුරප්පාඩු සේවා ශිෂ්‍යහට සංඛ්‍යාවක් ඇති බව නිරීක්ෂණය කෙරේ.

ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාව සතුව විවිධ ශ්‍රේණීන්ට අයත් 285152 ක ප්‍රමාණයක හමුදා සාමාජකත්වයත් පවතින අතර එම පිරිස විවිධ දක්ෂතා හැකියා සහ අධ්‍යාපන සුදුසුකම් ඇති නිලධාරීන් හා වෙනත් සේවකයන්ගෙන් සමන්විත වනු ලබයි. ඒ අනුව ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කර ගැනීමටත් රැකියා තෘප්තිය නංවාලීම තුළින් වඩා ගුණාත්මක සේවාවක් ලබා ගැනීමටත් ඔවුනට පුහුණුවීම් අවස්ථා සලසා දීමටත් ඒ තුළින් රැකියාවේ උසස්වීම් අවස්ථා නිර්මාණය කිරීමටත්, යෝග්‍ය වන අතර දැනට රටේ පවතින උසස් අධ්‍යාපන ආයතන වලින් හෝ වෙනත් සුදුසු වැඩ පිළිවෙලක් දැනට ක්‍රියාත්මක නොවන බැවින් ඒ සඳහා මෙම විශ්වවිද්‍යාලයේ කටයුතු ව්‍යාප්ත කිරීමේ හැකියාව අධ්‍යයනය කොට ක්‍රියාත්මක කිරීම සුදුසු බව පෙනීයයි.

### 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්වවිද්‍යාලයේ තනතුරු වලට බඳවා ගන්නා ලද පුද්ගලයන්ගේ උසස් අධ්‍යාපන සුදුසුකම් තහවුරු කර ගැනීමක් සිදු නොකරන බැවින් ව්‍යාජ සහතික ඉදිරිපත් කර කථිකාචාර්යවරයකු ලෙස වර්ෂයකට ආසන්න කාලයක් සේවයේ යෙදීමට පුද්ගලයෙකුට හැකියාව ලැබී තිබුණි. මෙවැනි තත්ත්වයන් මගින් විශ්වවිද්‍යාලයේ කීර්තිනාමයට මෙන්ම විශ්වවිද්‍යාලය ලබාදෙන සේවාවේ ගුණාත්මක තත්ත්වයටද අහිතකර බලපෑමක් ඇති වේ.

(ආ) වෛද්‍ය හේතූන් මත හමුදා සේවයෙන් 2009 දෙසැම්බර් මස ඉවත් කළ කෙඩෙට් නිලධාරියෙකුගේ නිරවුල් කිරීමේ කටයුතු නිම කරලීමට විශ්වවිද්‍යාලය මගින් 2010 අගෝස්තු 14 දක්වා කල් ගැනීම නිසා එම කටයුතු මාස 7 දින 14 ක ප්‍රමාදයක් පෙන්නුම් කරයි.

### 2.2.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

2009 ජුලි මස රු.61,600 ක් ගෙවා සේවකයන්ගේ පැමිණීම පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණ අතර යන්ත්‍රයේ වූ යම් යම් අඩු පාඩු හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ අවසානය දක්වා එය ඵලදායීව ප්‍රයෝජනයට ගෙන නොමැති අතර එහි වගකීම් කාලය ඉක්මවන තුරු එහි වූ දෝෂ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. මේ අතර එම යන්ත්‍රයේ වූ දෝෂ නොසලකා එම වර්ගයේම යන්ත්‍රයක් 2010 සැප්තැම්බර් මස රු.61,600 කට මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

## 2.2.4 අයවැය පාලනය

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) වර්ෂය තුළ දරන ලද පහත සඳහන් ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි.

| | <u>වටිනාකම</u> |
|---|---|
| | රු. |
| බෝධි ප්‍රාකාරය | 112,169 |
| සංචලනය කළ හැකි වේදිකාව | 623,788 |
| | ------------- |
| | <u>735,957</u> |

(ආ) අයවැය ශේෂයන් හා තථ්‍ය ශේෂයන් අතර 10% සිට 100% දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3. පද්ධති හා පාලන

-------------------

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව නිරීක්ෂණය වු දුර්වලතා වරින්වර විගණන විමසුම් මගින් උපකුලපතිවරයා වෙත පෙන්වා දෙන ලද අතර තවදුරටත් විශේෂ අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍ර පහත දැක්වේ.

(අ) ගිණුම් ඉදිරිපත් කිරීම.

(ආ) සලාක ලැබීම්

(ඇ) සැපයුම් හා සේවා

(ඈ) බඳවා ගැනීම්

(ඉ) වත්කම් පාලනය